සිංහල සාහිත්‍යයේ
'රහස් පරීක්ෂක'
හාමුදුරුවන්ගේ ආගමනය

ප්‍රථම මුද්‍රණය: 2025 මැයි

ISBN 978-624-5552-24-5
රහස් පරීක්ෂක හාමුදුරුවෝ
2025 © Muthumudalige Nissanka

මුද්‍රණය - එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො 27/18 ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.

සෝදුපත් පරීක්ෂාව - මිතුනි යසාරා
පරිගණක පිටු සැකසුම - කාවින්ද්‍යා රත්නායක
කවර නිර්මාණය - ප්‍රදීප් ප්‍රේමලාල්

ප්‍රකාශනය - පොත්මී ප්‍රකාශන

මෙම පොතෙහි සියලුම හිමිකම් ඇවිරිණි. කර්තෘගේ අවසරය නිසි පරිදි ලිපියකින් නොලබා මෙහි එන කිසිවක්ම, මොනම ආකාරයකින්වත් නැවත පළ කිරීම තහනම් වේ. එම තහනමට: අතින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, වීඩියෝ හෝ ඕඩියෝ ලෙස නිර්මාණය කිරීම, ඊ -බුක් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුළත් බව සලකන්න.

සියලුම හිමිකම් ඇවිරිණි. මුතුමුදලිගේ නිශ්ශංක 2025

මෙම කෘතිය පීඩීඑෆ් ලෙස බෙදාහැරීම සපුරා තහනම් බැවින් මෙය පීඩීඑෆ් කර තිබුණහොත් ඊට විරුද්ධව නීතීමය පියවර ගැනීම සඳහා පහත අංකය ඔස්සේ කරුණාකර පොත්මී වෙත දන්වන්න.
0776882324 www.pothmee.com

පූජ්‍ය
අඹුකොටුකන්දේ
ගෝතම හිමියන්ට
සිදුම

මට උන්වහන්සේව හමුවූවේ ඉතාමත් අහඹු ආකාරයෙනි. එසේ හමුනොවූවා නම් වසර තිහකට පසුවුව ද මේ කතා මාලාව ඔබ හමුවෙහි තැබීමට මා හට හැකියාවක් නොලැබෙනු ඇත. ඒ නිසාම උන්වහන්සේව මුණගැස්වූ මාගේ දෛවය, ඉරණම හෝ ඔබ පවසන්නා වූ ඒ ඕනෑම 'ජීවිතයේ අනපේක්ෂිත දායාදයකට' මම බොහෝ සෙයින් කෘතඥපූර්වක වෙමි.

හරියට ම, මීට වසර තිස් හතරකට පෙරාතුව එනම් 1990 වර්ෂයේ දී මම අම්පාර නගරයේ පදියතලාව නමින් හැඳින්වූ කුඩා ගමක පිහිටි පොලිස් ස්ථානයකට පත්වීමක් ලැබුවෙමි. එය සිදුවූවේ මේ ආකාරයෙනි.

මා පොලිස් වෘත්තියට ඇතුළත් වූයේ සැලකිය යුතු අධ්‍යාපන සුදුසුකමක් නොමැති තරුණ කොස්තාපල්වරයෙකු ලෙස යි. මගේ මුල් ම රැකියා ස්ථානය වූයේ මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිටි එරාවූර් පොලිස් මූලස්ථානය යි. එය 80 දශකයේ අග කාල වකවානුව වූ බැවින් යාපනය නගරයේ එල්.ටී.ටී.ඊ. ක්‍රියාන්විත දරුණු වෙමින්, ත්‍රස්තවාදීන් යුධ සේනාංක සමග දරුණුවට සටන් ඇවිළෙමින් තිබුණු කාලවකවානුවක් විය.

මට නිසි අධ්‍යාපන සුදුසුකමක් නොතිබුණත් මම නිර්භීත කෙනෙක් වූවෙමි. පොලිස් වෘත්තියට ඇතුල්වෙද්දීත් මාගේ සම වයසේ අයවළුන්ට වඩා හැඩි දැඩි සිරුරකින් ද, ශක්තිමත් බාහු සහ උස ශරීරයකින් ද යුක්ත වූ මා එකල මඩකලපුව එරාවූර් පොලිස් ස්ථානයේ සේවය කළ ශක්තිමත් ම සහ නිර්භීත ම පොලිස් නිලධාරියා ලෙස හැඳින්වීමේ වරදක් නැත.

මේ කාලය තුළ යාපනය ප්‍රදේශයෙන් ආරම්භ වූ දමිළ ඒකරාශී වීම් මඩකලපුව ප්‍රදේශය හරහාත් ව්‍යාප්ත වෙමින් තිබුණ අතර, යාපනය ත්‍රස්තවාදී කණ්ඩායම් ක්‍රමයෙන් නැගෙනහිර පළාත ද යටත් කරගනිමින්

සිටියහ.

මෙම යටත් කරගැනීම් කොතරම් දරුණුව පැතිර ගියේ ද යත්, වරක් එරාවූර් පොලිස් කඳවුරට ද ප්‍රබල ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ලවන්නට විය. එම ප්‍රහාරයේ දී එරාවූර් පොලිස් ස්ථානාධිපතිවරයා ඇතුළු ඒ වනවිට සේවය කරමින් සිටි සෙබළුන් දස දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් ජීවිතක්ෂයට පත්විය. ඉතුරු වූවේ පොලිස් සෙබළුන් පහළොස් දෙනෙකුට ආසන්න පිරිසක් පමණි. අපි සටන් කළෙමු. හැකි තරම් වේලාවක් අපගේ මුළු වෙරම යොදා සටන් කළෙමු. එහෙත් එය නිෂ්ඵල සටනක් විය. අප සතු බලය ක්‍රමයෙන් හීනවන්නට වූ අතර අපි සමග සිටි සෙබළුන් එකා දෙන්නා මැරී වැටෙන්නට විය. සටනින් මියයාම විනා ජීවිතය රැකගැනීමක් නොපෙනුණ තැන ඉතුරු වී සිටි අනිත් සෙබළු ද පොලිස් ස්ථානය හැරදා පලායන්නට පටන්ගත්හ.

එහෙත් ඔබට කියූ පරිද්දෙන් ම මම නිර්භීත පොලිස් නිලධාරියෙක් වීමි. මම යටත් නොවීමි. පලා නොගියෙමි. මා සමග රාජකාරී කළ අනෙක් උන් පලා යද්දීත් මම ත්‍රස්තවාදීන් සමග මුහුණට මුහුණලා සටන් කළෙමි.

මගේ නිර්භීතකමත්, පරාජය නොපිළිගැනීමත් හමුවේ, පලායමින් සිටි සෙබළුන් ද ධෛර්යයට පත්වන්නට ඇත. ඔවුහු ද මිලේච්ඡ ලෙස පලායාම පසෙක ලා මා සමග සිටගත්හ. එරාවූර් පොලිස් ස්ථානාධිපතිවරයා පවා මියගොස් සිටි

මොහොතක, මගේ ජවය සහ ජයග්‍රහණය කිරීමේ අභිප්‍රාය හමුවේ ඔවුහු ද යළි සටනට අවතීර්ණ වූහ.

අපි සටන් කළෙමු. එකා දෙන්නා මැරී වැටෙද්දීත් අපි නොනවත්වා ම සටන් කළෙමු. අපේ නිර්භීතකමත්, නොනවත්වා කළ ප්‍රතිප්‍රහාරත් හමුවේ ත්‍රස්තවාදීන්ගේ බලය ක්‍රමයෙන් පිරිහෙන්නට විය. ඔවුන්ගේ ප්‍රහාරයන්හි ශක්තිය අඩාලවන්නට පටන්ගත්තේ ය. මේ අතර මඩකලපුව යුධ හමුදා මූලස්ථානයෙන් පැමිණි සෙබළුන් ද අපේ ආරක්ෂාවට යුධ භූමියට අවතීර්ණ වූවෙන් ත්‍රස්තවාදීන්ගේ බලය අභිබවා අපේ බලය ක්‍රමයෙන් නැගෙන්නට පටන්ගත්තේ ය.

අවසානයේ දී, එතෙක් පරාජිතයන්ව පසුබායමින් සිටි අපි ජයග්‍රහණය කරන්නට පටන්ගත්තෙමු. පිරිහී ගොස් යටත් වීමට තිබුණු එරාවූර් පොලිස් ස්ථානයේ බලය තවදුරටත් තහවුරු කරගනිමින් අපි ජයග්‍රහණයේ මාවතට අවතීර්ණ වූවෙමු. ත්‍රස්තවාදීන්ට නොකඩවා ප්‍රතිප්‍රහාර එල්ලකරමින් ඔවුන්ව පලවාහැරීමට සමත් වූ අපි, සටනේ විජයග්‍රහණය තහවුරු කරගත්තෙමු.

ඔව් අපි ජයග්‍රහණය කළෙමු. එය දැවැන්ත ජයග්‍රහණයක් විය. එය

මගේ නිර්භීතකමත්, නොපසුබට උත්සාහයත් කොතරම් ජනප්‍රිය කළේ ද යත්, එරාවූර් පොලිස් ස්ථානය බේරාගැනීම වෙනුවෙන් මා හට විශේෂ වීර පදක්කමක් ද පිරිනැමුණේ ය.

එම ක්‍රියාව නිසාම එතෙක් කොස්තාපල්වරයෙකුව සිටි මම සහකාර පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස උසස් වීමක් ලැබුවෙමි.

මා ඔබට පැවසූ අම්පාර පොලිසිය සම්බන්ධ කතාවට මා අවතීර්ණ වන්නේ එයින් වසර තුනකට පසුව යි. එම වසර තුන පුරාම එරාවූර් පොලිස් ස්ථානයේ ම සහකාර පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස සේවය කළ මට දිනක් මගේ ප්‍රධානියා මෙම පණිවිඩය දැනුම් දුන්නේ ය. එයින් කියැවුණේ;

"අම්පාර පදියතලාව ග්‍රාමයේ ඇති එකම පොලිස් ස්ථානයේ පොලිස්පතිවරයා ත්‍රස්තවාදී ප්‍රහාරයක් නිසා තුවාල ලබා ඇති නිසාවෙන් එම පුරප්පාඩුවට මාව තාවකාලිකව පදියතලාව පොලිසියේ ස්ථානාධිපතිවරයා ලෙස ස්ථානගත කොට ඇති බව" යි.

මම එය භාරගත්තෙමි. ඉමහත් සතුටකින් භාරගත්තෙමි. යුද්ධය සහිත ස්ථානවල සේවය කිරීමට මම ප්‍රිය කළෙන් මෙම ස්ථාන මාරුව තවත් වීර ක්‍රියාවක ආරම්භය වනු ඇතැයි මම සිතුවෙමි.

එය එසේ ම විය.

එහෙත් මෙතැන් සිට ඇරඹෙන කතාවේ බොහොමයක් වීර ක්‍රියා මා නිසා සිදුවූවක් නොව මා ඔබට කියන්නට යන"උන්වහන්සේ" නමින් හඳුන්වන ප්‍රඥාවෙන් අනූන, අපූරු ඉවසීමක් සහ ඥාන සම්භාරයකින් හෙබි ඒ සුවිශේෂී පුද්ගලයා නිසා සිදුවූවකි.

උන්වහන්සේ හාමුදුරුනමකි. උන්වහන්සේගේ ගිහිකල නාමය ගැන මම කිසිම දිනෙක අසා නොතිබුණ නමුත් මට උන්වහන්සේව හමුවන විට ඒ ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ නම"ඇල්ලේ රාධ" නම් වූවේ ය.

මෙතැන් සිට ඇරඹෙන්නේ ඒ කතාව යි. උන්වහන්සේ, ඇල්ලේ රාධ එසේත් නැතහොත් අපේ කතාවේ ප්‍රධාන කතානායකයා වන රහස් පරීක්ෂක හාමුදුරුවන්ගේ කතාව යි. මේ කතාවට නිර්මිත ප්‍රවේශයක් ගැනීමට පෙරාතුව මා ඔබට මෙයත් පවසමි. ඔබ මෙය නිවැරදිව අවබෝධ කරගත යුතු ය.

මේ සියල්ල ම සිදුවූවේ මීට වසර තිහකට පමණ පෙරාතුව යි. දැනට පොලිස් වෘත්තියෙන් විශ්‍රාම ගොස් සිටින මම ඒ සිදුවීම් එකිනෙක හාරවුස්සා ලිවීමට පටන්ගන්නේ වසර තිහකට පසුව නිසාවෙන් මෙම කතාවේ යම් යම් තැන් මගේ මතකයෙන් ගිලිහී ගොස් තිබිය හැක. සමහරක් දෑ මට ඒ ආකාරයෙන් ම ලිවීමට නොහැකිවනු ද ඇත. එහෙත් මේ සෑම කතාවක් ම

මගේ මතක ශක්තියේ බලයෙන්, හැකි තරම් තෝරාබේරා, සිදු වූ සියල්ල ම ඒ ආකාරයෙන් ම සටහන් කිරීමට මම හැකිතාක් වෑයම් කරමි.

එසේම ඔබ දැනගත යුතු තවත් විශේෂ කරුණක් නම් මම ලියන්නෙක් නොවෙමි. මම පොලිස් නිලධාරියෙකි. ලිවීම කෙරෙහි මා හට ඇති අත්දැකීම් සහ හැකියාව පවතින්නේ ඉතාමත් අවම මට්ටමකිනි.

ඒ නිසා ම මෙය කියවන ඔබ අනිකුත් නවකතා හෝ කෙටිකතා මෙන් අපූර්ව චරිත සහ පරිසර විස්තර කිරීමකින් යුත් කතාවක් බලාපොරොත්තු විය යුතු නැත. එවන් විස්තර කිරීම්වලින් ඔබව මුසපත් කිරීමට මා දක්ෂයෙකු ද නොවෙමි. එහෙත් මට එක් දෙයක් පොරොන්දු විය හැක. මෙය ත්‍රාස්‍ය සහ කුතුහලෙන් ආඪ්‍ය වූ කතා පෙළකි. එනිසා ම එම ත්‍රාස්‍ය රසය හැකිතරම් තබාගනිමින් ඒවා මගේ හදවතට දැනුණු ආකාරයට

ම ඔබටත් දැනවීම උදෙසා සිදු වූ සියල්ල ම ඒ ආකාරයෙන් ම මෙහි සටහන් කිරීමට මම වෑයම් කරමි. මට පොරොන්දු විය හැක්කේ එපමණකි. ඒ සඳහා අපරාධ සම්බන්ධ මගේ දැනුම, මූලාශ්‍ර සහ උන්වහන්සේ එම අපරාධවල සුළුමුල සොයාගැනීමට භාවිතා කළ උපායමාර්ගත් අදාළ වනු ඇත.

ඉතින්, මා ඒ සියල්ල ම ඒ ආකාරයෙන් ම ලිවීමට වෑයම් කරමි. මේ සියලු ම කතා අනවශ්‍ය වැල්වටාරම් සහ විස්තර කිරීම්වලින් තොරවනු ඇත. නමුත් ඒවා ත්‍රාස්‍ය රසයෙන් පිරිපුන් බැවින් මේවා කියවාගෙන යන විට ඔබේ මනසට වෙහෙසක් හෝ කලකිරීමක් නොදැනෙනු ඇත. මෙම කතා මා රසවින්දාක් මෙන් ඔබත් දිනෙක මේවා රසවිඳිනු ඇත.

එසේ නම් අපි දැන් මෙම අපූර්වත ම කතා මාලාව ආරම්භ කළ යුතු ය.

මේ "ඇල්ලේ රාධ නොහොත් අපේ හාමුදුරුවන් වහන්සේගේ රහස් පරීක්ෂක කතා මාලාව" යි.

රහස් පරීක්ෂක හාමුදුරුවෝ

මුතුමුදලිගේ නිශ්ශංක

01

දුම්මාගල සියදිවි නසාගැනීම.

පදියතලාව කුඩා ගම්මානයකි. කොකාගල සහ දුම්මාගල යන කුඩා කඳුවැටි දෙකකින් සමන්විත මෙම ගම්මානය ලංකාවේ දැඩි දුෂ්කර ග්‍රීෂ්ම කලාපයක පිහිටා තිබුණ ද එය ගස්කොළන්, වනාන්තර සහ ගමට නුදුරෙන් ම ගලා බසින කුඩා ගංගාවකින් ද පිරි මනරම් ගමකි. මෙම ගම්මානයේ ඇති පොලිස් ස්ථානය පිහිටියේ අම්පාර ප්‍රධාන මාර්ගයට සමීපව ගම්මානයට ඇතුල්වෙන ඉසව්වේම ය. එතැන් සිට දිවෙන පටු පාරත්, දෙපස ම ගස් සහ ගල්වලින් පිරුණු වනාන්තර මාර්ගයත් පසුකරමින් පදියතලාව නම් මෙම සුන්දර ගම්මානයට පැමිණිය හැක. මෙම ගම්මානය යුධ කාලයේ දී ත්‍රස්තවාදී ප්‍රහාරවලට ලක්වූවා සේ ම, වල් අලින්ගේ තර්ජනවලටත් ලක්වූවෙන් වනාන්තරයත් ගම්මානයත් මායිම් වන තැන් කිහිපයක ම කම්බි වැටවල් ගසා ඇති බැව් පටු මාර්ගය දිගේ ගමන් කරන ඕනෑම අයෙකුට දැකගත හැක.

මෙය සිදුවූයේ ඉරිදා උදෑසන වරුවක ය. මට දවස හොඳහැටි මතක ඇත්තේ එය නිවාඩු දවසක් වූ නිසාවෙනි. නිවාඩු දිනයන්වල දහවල් වෙන තෙක් නිදාගැනීමේ පුරුද්දක් මට තිබුණෙන් එදිනත් - මගේ නිවසේ දුරකථනය නාද දෙන විට - මම ඇඳේ නිදාගෙන සිටියෙමි. වෙලාව දහවල් දහයට ආසන්න වන්නට ඇත. දුරකථනයේ හඬින් මගේ නින්ද කැඩී ගියේ ය. නින්දේ සිටියදී ම මම එය අතට ගෙන කනෙහි තබාගත්තෙමි.

"ලොකු සර්, ඔබතුමා ඉක්මනට ම මෙතැනට එන්න ඕන." ඒ මගේ සහයක නිලධාරියාගේ කටහඬ යි. එම හඬෙහි වූ බැරෑරුම්කමින් කුමක් හෝ අවාසනාවන්ත දෙයක් සිදුවී ඇති බැව් වටහාගත් මම වේගයෙන් ඇඳෙන් නැගිටගත්තෙමි. එය නිසැකව ම ත්‍රස්තවාදී ප්‍රහාරයක් විය යුතු ය.

"කොහෙටද ගහලා තියෙන්නේ?" මා ඔහුගෙන් එක්වර ම ඇසුවෙමි.

"නෑ සර්, කොටි ගහපු එකක් නෙමෙයි. මරණයක්... මට පේන විදියට සුයිසයිඩ් කේස් එකක්. කෙල්ලෙක් දුම්මාගල කන්දෙන් පැනලා මැරිලා." ඔහු මඳක් නතර විය. නිසැකව ම ඔහු සිටින්නේ දේහය ඉදිරිපිට විය යුතු ය. මට කරුණු කීමට ඔහු ඒ දෙස විමසිල්ලෙන් බලනවාක් විය යුතු ය.

"පොඩි කෙල්ලෙක්. වයස අවුරුදු විස්සක්වත් නැතිව ඇති, පෙනුමයි.

ඔව්, අපොයි දෙවියනේ...! මේක මහා නරක මරණයක් සර්, මෙයාව වැටිලා තියෙන්නේ ගස් මුලක් උඩට. අපොයි එහෙම වුණේ නැත්නම්..."

මම ඇඳෙන් නැගිට මගේ රාජකාරී ඇඳුම් ඇඳගන්නා ගමන් ඔහුගේ හඬට සවන් දුන්නෙමි.

"ඇයි එහෙම වුණේ නැත්නම් මොකද?"

"එහෙම වුණේ නැත්නම් ජීවත්වෙන්න තිබ්බා. උඩින් පැන්න වේගෙට මෙයාගේ ශරීරය උල අස්සට ම කිඳාබැහැලා ගිහින්. පව්... මෙතැන මේ මාරකය තිබ්බේ නැත්නම් මෙයාට මොන විදියකින් හරි ජීවත්වෙන්න තිබ්බා, අර කලින් කෙල්ල වගේම."

"කලින් කෙල්ල?"

"ඔව් සර්. මේ ගලෙන් ම පැනලා තවත් කෙල්ලෙක් මැරෙන්න හැදුවා. හැබැයි ඒක වුණේ නම් මේ ඉසව්වේ නෙමෙයි, එහා පැත්තේ."

"කවද්ද?"

"මීට අවුරුදු තුනකට විතර කලින් සර්."

"හරි, මම දැන්ම එනවා. හරියට ම ඔය කොයි හරියෙ ද?"

"සර් ගමට ඇතුල්වෙද්දී නළ ළිඳ තියෙන්නේ, එතැනින් වමට හැරිලා දුම්මාගල කන්ද පැත්තට එන්න. මම දැන් ටිකක් ඉස්සරහට ඇවිත් ඉන්නම්. නැත්නම් සර්ට මේ තැන හොයාගන්න අමාරුයි."

මම රිසිවරය තබා ඉක්මනින් ම සූදානම් වීමට පටන් ගත්තෙමි. මගේ පොලිස් ජීප් රථය මිදුලේ නවතා ඇත. මෙම කුළී නිවස පිහිටා තිබුණේ පොලිස් ස්ථානයට බොහෝම ආසන්නව බැවින් ගමට ඇතුළුවන පාරටත් එතරම් දුරක් නැත.

★★★

මම මැටි පාරදිගේ ගොස් නළ ළිඳ පෙනෙන හරියෙන් හමුවන අතුරු පාරකින් වමට හැරවූවෙමි. ගම්මානයේ ඇති කිසිම මාවතක් කාපට් කර නොමැති වූවෙන් මෙහි වාහනයකින් යාම බොහෝ සෙයින් අපහසු ය. මාවතට එබී ඇති ගස් අතුත්, කැලෑවේ සිට ගම්මානයට මාරුවන වල්සතුන් සහ පාර මැදින් ම ගමන් කරනා බයිසිකල්කරුවන් නිසාවෙන් ගම හරහා වාහනයකින් යාම බොහෝම සීරුවෙන් කළ යුතු එකකි. වමට හැරී දුම්මාගල කන්ද ආසන්නයට යත් ම මගේ සහයක නිලධාරියා වූ"සේපාල" ඒ අසල වූ තවත් අතුරු පාරක සිටගෙන සිටියේ ය.

"සර්..." මාව දුටු විගස ම සැලියුටයක් ගසා ආචාර කළ ඔහු ජීප් රථයට ගොඩවිය.

"ඔහොම ම ඉස්සරහට යමු සර්. වනාන්තරයට වැහිලා නිසා මේක ටිකක් අන්ධකාර පාරක්, සර්ට ජීප් එකත් බාගයක් දුරින් නවත්තන්න වෙනවා."

"දැන් එතැන කවුද ඉන්නේ?"

"මම කොස්තාපල් බණ්ඩාරව තියලා ආවේ. දඩයමේ ආපු ගම්මු ටික දෙනෙකුත් ඉන්නවා, අද ඉරිදනේ."

ඔහු එසේ පවසමින් මා දෙස බැලුවේ ය. ඇමතුම ආ සැණින් ම මම සූදානම් වූවෙන් මුහුණකට සෝදා ගැනීමටවත් මට වේලාවක් තිබුණේ නැත. දෑස් අතකින් පුංචි කරගත් මා, වනාන්තරය නිසා ක්‍රමයෙන් අන්ධකාර වෙමින් යන මාර්ගය දෙස බලමින් ජීපයේ විදුලි පහන් දල්වා ගත්තෙමි.

"සේපාල කෝල් කරද්දි මම නිදාගෙන හිටියේ. කවුද කෙල්ලෙක් කිව්වා නේ?"

"ඔව් සර්, පොඩි කෙල්ලෙක්. පොඩියි කිව්වේ ඇඟපත එහෙම පොඩි කෙල්ලෙක්. වයස නම් විස්සට වඩා වැඩි වෙන්න ඇති, අපරාදේ අර ගස් උල එතැන තිබ්බේ නැත්නම් ජීවත්වෙන්න තිබ්බා. වැටිලා තියෙන්නෙම ඒක උඩට. එහෙම නැත්නම්

වැටිලා මැරෙන්න තරම් ලොකු උසකින් නෙමෙයි පැනලා තියෙන්නේ. යමුකෝ සර්ටම බලාගන්න පුළුවන්."

අන්ධකාර වන ලැහැබ තුළින් ජීප් රථය ඉදිරියට ගෙන ආ මම සූර්යයාලෝකයෙන් මඳක් ආලෝකමත් වී තිබුණු ස්ථානයකට ආවෙමි.

"සර් ඔතැනින් ජීප් එක නවත්වන්න... අපිට මෙතැන ඉඳන් පයින් යන්න වෙනවා."

මම ජීප් රථය එතැන නැවැත්වුවෙමි. මෙය කැලෑවේ මඳක් එළිපෙහෙළි වූ තැනකි. එතැන් සිට පැති දෙකකට යන තවත් කුඩා අඩිපාරවල් ඇත.

"එන්න සර්..." සේපාල මට ඉස්සර විය. මම ඔහු පසුපසින් යන්නට වීමි.

"සර් මෙහෙට අලුත්නේ, ඒ නිසා පරිස්සමින්. සර් දන්නැති දේවල් මේ කැලෑ පාරවල්වල බොහොමයි. ඔය ගස් අතු..." කී ඔහු අඩි පාර දෙසට ඉලිප්පී ඇති ගස් අතු දෙස බොහෝම ඕනෑකමින් බලා ඒවාට නොගැවී මගහරින්නට විය.

"මේක සර්ප විමානේ, ඔය ගස්වලත් එල්ලිලා ඉන්නවා සමහර වෙලාවට."

මම ද බොහෝ පරීක්ෂාශීලී වූවෙමි. ජීපයේ තිබුණු පොලිස් වෝකි ටෝකිය ඒ මොහොතේ මගේ අතේ තිබුණෙන් එයත් බඳපටියේ අටවාගත් මම බොහොම පරිස්සමින් ඉදිරියට යන්නට වීමි.

ටික මොහොතකින් පසු අපිට සූර්යයාලෝකය යහමින් ලැබුණු මඳක් විවෘත ප්‍රදේශයකට පැමිණීමට හැකි විය. සේපාල විසින් පැවසූ මළසිරුර තිබුණේ එතන ය.

ඒ වන විටත් මළසිරුර වටා ගැමියන් කිහිපදෙනෙකු වට වී සිටියෙන් ඔවුන්ට එම ස්ථානයෙන් ඉවත් වන්නැ යි කී මම මළසිරුර තිබුණු ගස් මුල ආසන්නයට ළඟා වූවෙමි. සේපාල කී ආකාරයට ම ඇයගේ සිරුර වැටී තිබුණේ මුල අසලින් කපා තිබුණු ගසකට ය. මම ඇයගේ දේහයට තවත් ළංවුණෙමි. ගසේ පැත්තකින් එළියට ඉලිප්පී ඇති පතුර ඇයගේ සිරුර තුළට කිඳාබැස අනිත් පසින් එළියට විත් ඇත. ඇයගේ සිරුරේ ගසට කිඳාබැස ගිය තැනින් තවමත් රුධිරය ගලායයි. ඇයගේ දෑස් තවමත් විවෘත වී ඇත. ඒවා එකඑල්ලේ ම එල්ල වී ඇත්තේ ඉහළට ය.

මම හිස ඔසවා ඇයගේ දෑස් ඉලක්ක වී ඇති තැන දෙස බැලුවෙමි. ඒ නිසැකව ම ඇය බිමට පැන්න ස්ථානය විය යුතු ය. කන්දේ ඉදිරියට ඉලිප්පී ඇති කළුගලක් අඩි කිහිපයක් උඩින් පෙනෙයි. මෙම කඳු බෑවුම පොළොවෙන් ඉහළට උස් වී ඈතට විහිදී යන ගස්වලින් පිරුණු ගල්තලාවක් නිසාවෙන් දුම්මාගල කන්ද එම බෑවුමට එකතු වී වනාන්තරයෙන් වැසී ගොස් ඇත.

"සේපාල කිව්ව කතාව හරි, මේ කෙල්ලව හරියට ම උල උඩට වැටිලා තියෙන්නේ. එහෙම වුණේ නැත්නම් ජීවත්වෙන්න තිබ්බා. අඩුම තරමින් උඩ ඉඳන් පනින කෙනෙක්ව බෑවුමේ තියෙන ගස් අත්තක වැදිලා හරි නතර වෙනවා. ඒත් අවාසනාවට මේ කෙල්ල හරියට ම පැනලා තියෙන්නේ මෙතැනට."

"ඔව් සර්.. ඔය උඩ බලන්න, මෙතැන විතරයි ටිකක් හරි විවෘත ස්ථානයකට තියෙන්නේ. උඩ ඉඳන් බැලුවම පොළොව පේන්නේ මෙතැන විතරක් නිසා කෙල්ල සමහරවිට මෙතැනට ම ඉලක්ක කරන්න ඇති. මේක නම් මැරෙන්න ම හිතාගෙන පැන්න එකක්."

"වෙන්න පුළුවන්." කී මම යළිත් මළසිරුර අසලට නැඹුරු වුණෙමි.

ඔබට පැවසූ ආකාරයට ම මෙය මඳක් විවෘත ස්ථානයක් නිසාවෙන් උඩ සිට පැමිණෙන පැහැදිලි සූර්යයාලෝකය හරියට ම මළසිරුර මතට වැටී ඇත.

ඇය ඇඳ සිටින්නේ රතු කුඩා මල් පිරුණු සුදු ගවුමකි. ඇයගේ පාදයක එක් සෙරප්පුවක් ඇති අතර අනෙක ඒ අසල ම වැටී ඇත. කුමක් හෝ හේතුවකට ඇයගේ දැතම ශරීරයත් පසාරු කරගෙන ඉහළට ආ ගස් උල මත රැඳී ඇත. මම එතැනින් නැගිට ඒ අවට සිටි ගැමියන් දෙස බැලුවෙමි.

"සේපාලට කවුද මේ සිද්ධිය දැනුම් දුන්නේ?"

"උදේම පොලිසියට දුවගෙන ආපු වයසක උන්දෑ කෙනෙක් සර්. අර ඉන්නේ.. ඔය මනුස්සයා කැලෑ පාරෙන් එද්දී තමයි මේක දැකලා තියෙන්නේ. ඒ පාර කලබල වෙලා පොලිසියට දුවගෙන ඇවිත්. මේ ගමේ ගෙවල්වල ටෙලිෆෝන් නෑනේ සර්, ටවුමේ තිබ්බට."

"හ්ම්... තමුන් කීයට විතරද මේක දැක්කේ?" මම ඔහු දෙස බලා මඳක් උස් හඬින් ඇසුවෙමි.

ඔහු උඩුකය නිරුවත් වූ, සිහින් සිරුරක් ඇති වයසක කෙනෙකි. ඔහුගේ කරේ කුඩා පොරෝ තලයකි. මම ප්‍රශ්නය අසත් ම කරේ වූ පොරොව අතට ගත් ඔහු එය එක් අතෙක රුවා ගත්තේ ය.

"උදේ මම දර ටිකක් හොයන්න කියලා ආන් අර පැත්තේ කරක් ගැහුවා මහත්තයෝ." ඔහු අතේ වූ පොරොව වනාන්තරයේ එක් පසෙකට හැරවූවේ ය.

"ආන් එතකොට තමයි දැක්කේ මේ ඉසව්වේ සුදු පාට යමක් වැටිලා තියෙනවා. ළඟට ඇවිත් බලද්දි තමයි මේ දැරිව්ව දැක්කේ."

"එතකොට තමුන් දන්නව ද මේ කවුද කියලා?"

මම එසේ අසද්දී ඔහු දෑස් කුඩා කරමින් මළසිරුර අසලට පැමිණෙන්නට විය.

"මම හිතන්නේ මහත්තයෝ මේ කෙල්ල අපේ ගමේ කෙල්ලෙක් වෙන්න බෑ, සමහර විට එහා ගමේ කෙනෙක් වෙන්න ඇති. කොහොමත් ඔය ගලේ අනිත් බෑවුම තියෙන්නේ මේ ගම්මානයට නෙමෙයි එහා ගම්මානයට."

"ඔව් සර්... මේ ගලේ අනිත් බෑවුම තියෙන්නේ එහා ගම්මානයට, ඒ මනුස්සයගේ කතාව හරි." සේපාල ද කියන්නට වූවෙන් මම යළිත් ඉහළින් පෙනෙන කන්ද දෙස බැලුවෙමි.

"එහෙනම් මොකක්හරි හේතුවකට මේ කෙල්ල මෙතැනදී ම ගලෙන් පහළට පැනලා තියෙනවා."

ඒත් සමග ම -

පාඨකයිනි, අපි කතාවේ එම හමුවීමට පැමිණෙන්නේ මෙතැනදී ය.

මට මෙම සිදුවීම ජීවිතයේ කිසිම දවසක අමතක නොවන එකකි. අදත්, වසර තිහකට පසුව ඔබ වෙනුවෙන් කතාව ලියන මේ මොහොතෙත්, එය සිදු වූ ආකාරයෙන් ම මගේ මනස තුළ රැඳී ඇත.

මා එම අපූර්ව අවස්ථාව මෙලෙස සටහන් කරමි...

ඒ මොහොතෙ ම, මට වනාන්තරය තුළින් ගැඹුරු, උස් කටහඬක් ඇසුණේ ය. මා මෙහිදී"මට" යැයි පැවසුවේ එම කටහඬ කුමක් හෝ හේතුවකට මගේ මනසට තදින් ම කා වැදුණු නිසාවෙනි. සමහරවිට -අපේ හමුවීම මේ ආකාරයෙන් සිදුවන බැව් දෛවය නම් ඒ අපූරු පුද්ගලයා දැනගෙන සිටින්නට ඇත.-

"එතකොට මහත්තයා කියන්නේ මේක සියදිවි නසාගැනීමක් කියල ද?"

මම එක්වර ම කටහඬ ආ ස්ථානයට දෑස හැරවූවෙමි. මා සේ ම සේපාල ද ඒ දෙස බැලුවේ ය. එය ආවේ වනාන්තරයේ අඳුරු ස්ථානයකිනි. විශාල මාර ගසකින් අඳුරු වී තිබුණු එම ස්ථානයේ සිට ඡායාවක් අප දෙසට පැමිණෙන්නට වූවෙන් මම විස්මයෙන් දෑසත් විශාල කොටගෙන ඒ දෙසට ම හැරී සිටියෙමි.

වනාන්තරයෙන් මතුවූවේ ස්වාමීන්වහන්සේ නමකි.

උන්වහන්සේ ඇඳ සිටි කසාවන් සිවුර, ආලෝකයට පැමිණෙත් ම සූර්යය කාන්තියෙන් දිලිසෙන්නට පටන්ගත්තෙන් උන්වහන්සේව මට පෙනුණේ අන්ධකාරයෙන් මතු වූ දේව උත්තමයෙකු සේ ය. උන්වහන්සේගේ රූපය මුලින් ම ඇසගැසුණු මොහොතේ මා කොතරම් විස්මයට පත්වූවාදැ යි ඔබට කියුවහොත්, ඒ සඳහා ඕනෑ කරන වචන සොයාගැනීමට-වත් මගේ දැනුම ප්‍රමාණවත් නොවනු ඇත.

උන්වහන්සේ අප ඉදිරියට එත් ම එතැන සිටි ගැමියෝ එකා දෙන්නා උන්වහන්සේ ඉදිරියේ දණගසා වඳින්නට වූවෙන් මම ද දැත් එකතු කොට උන්වහන්සේට වැන්දෙමි.

"සුවපත් වේවා!" උන්වහන්සේ සිවුරෙන් ගත් අතක් මගේ හිසට දිගුකොට පැවසුවේ ය.

එසේ පවසා මඳ දුරක් ඉදිරියට ගමන් කළ උන්වහන්සේ මළසිරුර ඉදිරියෙන් නැවතී මොහොතක් ඒ දෙස බලා සිට, උන්වහන්සේගේ දෑස් උඩින් පෙනෙන සුවිසල් ගල දෙසට හැරවූවේ ය.

"මේක සියදිවි නසාගැනීමක් නෙමෙයි මහත්තයා, මේක ඝාතනයක්..."

"මොකක්!" මම යළිත් වික්ෂිප්තව ගියෙමි."ඔබවහන්සේ කොහොම ද එහෙම කියන්නේ?"

"මහත්තයා හොඳට අර ගල දිහා බලන්න, ගලේ නෙරුම තියෙන්නේ ඒ තරම් උසකින් නෙමෙයි. ඕනෙ නම් ඔතැන ඉඳන් මේ ගස මුලට අඩි තිහක් විතර ඇති. මේ කෙල්ල උඩ ඉඳන් වැටුණු විදියටම යි මේ ගස මුලට වැටිලා තියෙන්නේ?"

"උඩු අතට..." මම මිමිණුවෙමි.

"ඔව් උඩුබැලි අතට... මේ දරුවා උඩ ඉඳන් පැන්න නම් මහත්තයට මළකඳ දකින්න වෙන්නේ ඔය පැත්තට නෙමෙයි මුණින් අතට. අනික මහත්තයෝ ඔය උල, ඕක කපාපු ගහක් නෙමෙයි හුළඟට ඉදිරිලා කඩාගෙන වැටුණු ගහක්. ඒක තමයි ඕක ඔය විදියට පැත්තකට කඩා වැටිලා එක තැනකින් කඩතොලු වෙලා තියෙන්නේ. ගස් කපන්නෙක් ඕක කැපුව නම් ඔතැන තියෙන්න ඕනේ පොරෝ පාරවල්, කපාපු තැන ටිකක් පැතලි වෙන්න ඕන, එහෙත් එහෙම ලකුණක් මෙතැන නෑ." උන්වහන්සේ හිස හරවා ඒ අසල වටපිට බැලුවේ ය.

"නිසැකව ම මේක මාස කිහිපයකට කලින් කඩාගෙන වැටුණු ගහක්... මේ පොරෝ කරේ තියන් ඉන්න උන්දැලාම ගහ කැලි කපලා අරගෙන යන්නත් ඇති, ඒකයි ඒක දැන් අහලකවත් නැත්තේ."

උන්වහන්සේ අසල සිටි ගැමියෙකු දෙස බලා කීවෙන් ඔහුගේ මුහුණු අඳුරු වී යන්නට විය.

"හ්ම් කොහොමහරි... මේ දැරිවි මැරෙන මොහොතේ ජීවිතෙත් එක්ක සටනක් කරලා තියෙනවා. මහත්තයට පේනවනේ ඔය උල අල්ලගෙන ඉන්න හැටි?" කී උන්වහන්සේ මා දෙස බොහෝම ගැඹුරු බැල්මක් හෙළුවේ ය.

"මේක ඝාතනයක් මහත්තයෝ... මහත්තයලා අර ගල මුදුනට ගිහින් හොඳට පරීක්ෂා කරලා බලන්න, මහත්තයලට මොකක්මහරි හෝඩුවාවක් හම්බවෙයි."

එපමණකි... උන්වහන්සේ එතැනින් හැරී වනාන්තරයේ උන්වහන්සේ පැමිණි අඳුරු ඉසව්ව දෙසට ම යන්නට පටන්ගත්තෙන්, ගැමියන් එකා දෙන්නා බිම වැටී උන්වහන්සේට

වන්දනාමාන කරන්නට විය. මම සිටගෙන ම සිටියෙමි. ඒ ගැන මට කල්පනාවක් වූවේ නැත.

"ඔබවහන්සේ කවුද?" මම ඒ මොහොතේ උන්වහන්සේගෙන් ඇසූ බැව් මතක ය.

"මම වනවාසී හාමුදුරුකෙනෙක්. මට ඕවා අකැපයි, මම මේ පැත්තෙන් යද්දී ඔය මහත්තයගේ කතාව ඇහිලයි නැවතුණේ. ඔබතුමාගේ නිගමනය වැරදියි. මම ඒක නිවැරදි නොකළ නම් මේ දැරිවියගේ ආත්මයටවත් සැනසිල්ලක් ලැබෙන එකක් නෑ."

උන්වහන්සේ එසේ පවසමින් ම එතැනින් අතුරුදහන් වී ගියේ ය.

★★★

එයින් පසුව අපි කඳුගැටය නැග තරුණිය වැටී සිටි ස්ථානයට එකළුල්ලේ ම පෙනෙන වනාන්තරයට නෙරා ආ ගල්තලාව පරීක්ෂා කරන්නට පටන්ගත්තෙමු. මෙය මඳක් තැනිතලා ගල්තලාවකි. එහි සෑම පැත්තක් ම පාහේ පඳුරු සහ වන බූටෑවෙන් වැසී ඇත. එහෙත් වනාන්තරයට නෙරාගිය ගල්තලාව පමණක් විවෘත ස්වරූපයක් ගත්තේ ය.

"සර්, මෙතැන හරි භයානක තැනක්... ඒ තරම් උසක් නැතිවුණාට මීට කලිනුත් මෙතැනින් පැනලා කිහිපදෙනෙක් සියදිවි නසාගන්න උත්සාහ කරලා තියෙනවා." සේපාල ගල්තලාවේ නෙරුම දෙසට යමින් කීවෙන් මම ඒ අවට හොඳින් පරීක්ෂා කරන්නට පටන්ගත්තෙමි.

මෙතැනට ගලේ නෙරුම පමණක් පැහැදිලිව පෙනුණත් කන්දක් සේ ඇතට දිවයන කොටස සම්පූර්ණයෙන් ම කැලෑවක ස්වරූපයක් ගනියි. ගල්තලාව පවා තැනින් තැන පඳුරු සහ ඒ මත පැළවුණු ගස්වලින් ආවරණය වී ඇත.

ගල්තලය දිගේ එහි වනාන්තරයට නෙරා ඇති කොටස දෙසට ගමන් කළ මම තරුණිය වැටුණා යැයි සැක කළ ස්ථානයෙන් එබී පහත බැලුවෙමි.

"මෙතැන තමයි තැන." මම සේපාලට කීවෙන් ඔහු ද යාන්තමින් අඩිය තබමින් ගල්තලාවේ දාරයට විත් පහතට හිස එබුවේ ය. ගම්වැසියන් රොක්වී සිටින සැටි පහතින් පෙනෙයි.

"ඔව් සර් මෙතැනින් තමයි වැටිලා තියෙන්නේ."

මම ඒ අවට පරීක්ෂා කෙරුවෙමි. අපේ පාදයන් අසල ම පඳුරක් මත පොත් කිහිපයක් වැටී ඇත. ඒවා අතට ගත් මම එකිනෙක පෙරළා බැලුවෙමි.

"මේ කෙල්ලගේ අතේ තිබුණු පොත් වෙන්න ඕන. මෙයා පොත් ටික මෙතැනින් තියලා කන්දෙන් පහතට..." මම එතැනින් වචනය නවත්වා ගතිමි. ඇය 'පැන්නා' කියන්න ද නැතහොත් 'වැටුණා' කියන්නදැ යි මා සිතන්නට

වීමි. මෙම වචන දෙක මත සමස්ත පරීක්ෂණය ම තීරණය වන නිසාවෙන් මුලින් ම මේ දෙකෙන් කුමක් නිවැරදිදැ යි තෝරාබේරා ගත යුතු ය.

එතැන සාමාන්‍ය පෙළ විභාගයේ පෙරහුරු ප්‍රශ්න පොතක් සහ ලියන පොත් දෙකක් විය. එහි එක් පොතක ඇයගේ නම ලෙස"සඳලි හේරත්බංඩා"යැයි සඳහන් වී ඇත.

"සඳලි..." මම ඒ නම දෙස බලාගෙන කීවෙමි.

එතැන ඊටත් වඩා වැදගත් සක්ෂියක් නොවී ය. ඒ වන විටත් ඉර මුදුන් වී තිබුණෙන් ගල්තලාව සූර්යයාලෝකයෙන් පිරීගොස් තිබුණේ ය. මම අතේ වූ වෝකි ටෝකිය ගෙන ඉහළට ඔසවා එයින් ඇමතුමක් අම්පාර ප්‍රධාන පොලිස් ස්ථානයට ගැනීමට වෑයම් කළෙමි. එහෙත් එය අසාර්ථක විය.

"මෙතැනට සිග්නල් නෑ සර්, ඕක මේ කන්ද පැත්තට නම් කොහෙත්ම වැඩ කරන එකක් නෑ. ටවුන් එක තියෙන්නේ අන්න අර පැත්තේ." සේපාල කන්දේ විරුද්ධ පැත්තට අත දිගු කර පෙන්නුවෙන් මම ද ඒ පැත්ත බැලුවෙමි. මෙතැන් සිට පදියතලාව ටවුමට කිලෝමීටර් දහයක්වත් දුර ය.

"මම කියන්නම්, සේපාල මෙතැන ඉන්න. කාටවත් ගල උඩට එන්න දෙන්න එපා. අර පල්ලෙහා ඉන්න කොස්තාපල්ව මම යමින් ගමන් එතැනම මුරට තියන්නම්. මම දැන් ටවුන් එකට යන්න ඕනේ. එතැනින් හෙඩ් ඔෆිස් එකට කෝල් එකක් ගත්ත නම් දැන්ම කෙල්ලගේ බොඩි එක මෙතැනින් අයින් කරගන්න පුළුවන්." කී මම සේපාලට කන්ද උඩ රැඳී සිටින්නැයි පවසා, පොත් කිහිපයත් අතට ගෙන ගල්තලාවෙන් බිමට බැස්සෙමි. ඒ එද්දිත් තරුණියගේ මළසිරුර තිබුණු ස්ථානය තවත් ගැමියන් කිහිපදෙනෙක්ගෙන් පිරී තිබුණි. ඔවුන් ඉදිරියේ සිටගත් මම මියගොස් සිටි ගැහැනු ළමයාගේ නම හැමෝටම ඇසෙන්නට කීවෙමි.

"මේ කෙල්ලගේ නම සඳලි හේරත්බංඩා. කවුරුහරි එහෙම නමක් දන්න කෙනෙක් ඉන්නව ද?"

ඔවුන් එකා දෙන්නා එකිනෙකාගේ මුහුණවල් දෙස බලාගත්තාක් මිසක කිසිවෙකුගෙනුත් ප්‍රතිචාරයක් නොවී ය. මගේ ඇස් පොතේ ඇති ඇයගේ වාසගමට යා විය.

"හේරත්බංඩා.. මේ කෙල්ලගේ තාත්තා හෙරත්බංඩා වෙන්න ඕන. එහෙම කෙනෙක් මේ ගමේ ඉන්නව ද?" මම යළිත් කෑ ගසා ඇසූවෙන් එතැන සිටි ගැමියෙක් ඉදිරියට විත් මැරී සිටි කෙල්ලගේ මුහුණට නැඹුරු වී බැලුවේ ය.

"සර්, හේරත්බංඩා නම් මම දන්නවා. එතකොට මේ..." ඔහුගේ දෑස් විශාල වී ගියේ ය."දෙයි හාමුදුරුවනේ...! හේරත්බංඩාගේ කෙල්ලෙක් ද මේ

එතකොට?" ඔහු කෙදිරිල්ලක් පිටකළෙන් මම එතැනින් හැරී ජීප් රථය දෙසට එන්නට වීමි.

තවත් සුළු මොහොතකින් ගැමියන් විසින් ම ඇයගේ දෙමව්පියන්ව සොයාගනු ඇත. එම කොටස ඔවුන්ට භාර දී මම හැකි ඉක්මනින් ම 'මරණ පරීක්ෂණය' අවසන් කිරීම සඳහා අම්පාර පොලිසියට මේ ගැන දැනුම් දී මරණ පරීක්ෂකවරයෙකුව ගෙන්වා ගත යුතු ය.

යළිත් පොලිස් ස්ථානයට යන ගමනේ දී මගේ මනස නිරායාසයෙන් ම උන්වහන්සේ ගැන සිතන්නට පටන්ගත්තේ ය.

උන්වහන්සේ කැලෑවෙන් එළියට පැමිණි එම අවස්ථාව මායාවක් වැනි ය. එවන් ගුප්ත වූත් මායාන්විත වූත් දර්ශනයක් මා මීට පෙර දැක නැත්තෙන් එම මොහොත කිසිම දිනෙක මගේ මනසින් පහව නොයනු ඇත. හැරත් උන්වහන්සේගේ හඬෙහි වූවේ ගැඹුරු නිශ්චිත බවකි. මෙම මරණය ඝාතනයක් බැව් උන්වහන්සේ කීවේ ඒකාන්තව ය. එය එසේම විය යුතු යැයි මම ද සිතුවෙමි.

එහෙත් පාඨකයිනි, එය එසේ වූවේ නැත...

අම්පාර පොලිස් ස්ථානයට සිදුවීම ගැන දැන්වූ පසුව අපට එම මරණයේ කටයුතු ක්ෂණිකව විභාග කිරීමට 'මරණ පරීක්ෂකවරයෙකු' ව එවනු ලැබුවේ ය. ඔහු ගල්තලාවත්, මැරිසිටි තරුණියවත් පරීක්ෂා කොට ඔහුගේ අතේ වූ ලිපිගොනුවල ඒවා වාර්තාගතකොට ගත්තේ ය.

අවසානයේ දී, සියළුම පරීක්ෂණ අවසන්කොට මරණ පරීක්ෂණ වාර්තාවේ පිටපතක් මා අත තැබූ ඔහු ෆයිල් කවරය වසා මෙසේ කීවේ ය.

"මේක සියදිවි නසාගැනීමක්..."

ඔහුගේ පිළිතුරෙන් මා වික්ෂිප්ත වූවෙමි.

"මහත්තයා ඔබට හොඳටම විශ්වාස ද මේක සියදිවි නසාගැනීමක් කියලා?" මම ඔහුගෙන් ප්‍රශ්න කෙරුවෙමි.

ඔහු තරුණ මරණ පරීක්ෂකවරයෙකි. ඔහුට යම්කිසි තැනක් වැරදෙන්නට ඇත. මා එසේ සිතුවෙමි. මගේ ප්‍රශ්නයෙන් තරුණ නිලධාරියා සතුටු වූ බවක් ද පෙනෙන්නට නොතිබිණි. මම ඔහුගේ නිගමනය අවතක්සේරු කරන්නේ ය යන සිතුවිල්ල ඔහු තුළ පැන නගින්නට ඇත.

"ඔව් මට විශ්වාසයි, මම ඕකේ සේරම ලියලා තියෙන්නේ." ඔහු ඕනෑවට එපාවට මෙන් කියාදැම්මේ ය.

මම ඔහු විසින් දුන් වාර්තාව යළිත් නිරවුල් ව කියවන්නට පටන් ගත්තෙමි.

ඒ අතර මියගිය සඳලි නම් තරුණියගේ දෙමව්පියන් ද එතැනට පැමිණ සිටියෙන් ඔවුන්ගේ ළතෝනිය ද පසෙකින් ඇසෙන්නට පටන්ගත්තේ ය.

"එතකොට මේ මළසිරුර පහතට වැටිලා තියෙන විදිය ගැන ඔබ මොකක්ද හිතන්නේ?" මම ඔහුගෙන් යළිත් ප්‍රශ්න කළෙමි.

"ඒ කිව්වේ?"

"ඒ කිව්වේ මහත්තයා මේ මළසිරුර තියෙන්නේ උඩුබැලි අතට වැටිලා. සියදිවි නසාගැනීමක් නම් මේක තියෙන්න ඕන මුණින් අතට නෙමෙයි ද?"

"වෙන්න පුළුවන්, ඒත් අපිට ඒ කරුණ නිසාම තීරණය කරන්න බෑ මේක ඝාතනයක් කියලා. අනික මම කන්ද මුදුනත් පරීක්ෂා කළා. මේ තරුණිය හැරෙන්න වෙන අය එතැන හිටිය බවටවත්, පොරබැදීමක් හෝ පහරදීමක් සිදු වූ බවටවත් කිසිම සාක්ෂියක් නෑ. අනික... මේක ඝාතනයක් නම් බොහෝ විට පොරබැදීමක් සිද්ධවෙන්න ඕන. එහෙමත් නැත්නම් කිසියම් ආකාරයක තල්ලු කිරීමක්.. එහෙම නැතුව මෙයාව එකපාර ම කන්දෙන් පහළට වැටෙන්න විදියක් නෑ. අනික මේ තරුණියගේ අත්පාවලවත් එහෙම සලකුණක් නෑ." ඔහු එසේ කීවේ ඇයගේ සිරුර දෙස බලන ගමන් ය.

මේ වෙද්දී ඇයගේ සිරුර ගස් උලෙන් ඉවත් කොට එය සුදු රෙද්දකින් වසා ගැමියන් විසින් ම සෑදූ අතු ඇඳක තබා තිබුණි. තවත් සුළු මොහොතකින් එය ගිලන් රථයක ආධාරයෙන් පදියතලාව රෝහල වෙත ගෙන යනු ඇත.

"මහත්තයට මේ ගැන තවදුරටත් සැකයක් තියෙනව නම් අපිට මේකේ වෛද්‍ය පරීක්ෂණයත් කරන්න පුළුවන්. වෛද්‍ය පරීක්ෂණ වාර්තාව හරහා ඔබට පුළුවන් වෙයි මෙයාගේ ශරීරයේ පහරදීමක හෝ පොරබැදීමක සලකුණු තියෙනව නම් සොයාගන්න. ඔබට ඒකෙනුත් සෑහීමකට පත්වෙන්න බැරි නම් හොඳම දේ තමයි අධිකරණයේ අවසරයක් අරගෙන රස පරීක්ෂණයකට යන එක."

ඔහු කීවෙන් මම මොහොතකට නිහඬ වූවෙමි. තවමත් මෙය සියදිවි නසාගැනීමක් යැයි තීරණය කිරීමට මගේ සිත ඉඩ නොදෙයි.

"එතකොට ඔබතුමා ඒකාන්තව ම කියන්නේ මේක සියදිවි නසාගැනීමක් කියලා?"

"ඔව්, දැනට තියෙන සාක්ෂි අනුව එහෙමයි. ඒත් ඔබට මේ ගැන වෙනත් හෝඩුවාවක් ලැබුණොත් අපි කලින් කිව්ව විදියට රස පරීක්ෂණයකට යන්න පුළුවන්."

මරණ පරීක්ෂකගේ නිගමනය එය විය. ඒ ගැන මගේ සිතේ සතුටක්

නොවූවත් එය නොපිළිගෙන සිටීමට හැකියාවක් ද මට නොවී ය.

★★★

මරණ පරීක්ෂණයෙන් පසුව තරුණියගේ දේහය රෝහලට යැවූ අතර මම යළිත් පොලිස් ස්ථානය කරා ගියෙමි. එදින රාත්‍රිය පුරාම මම සිටියේ නිදිවර්ජිතව ය. මරණය පිළිබඳව වූ මතකයන් මගේ මනස තුළ කැකෑරෙමින් තිබුණේ ය. විශේෂයෙන් ම මරණ පරීක්ෂකවරයා මෙය සියදිවි නසාගැනීමක් යැයි පැවසීම මගේ පසුතැවිල්ලට හේතුවක් විය. ඒ වෙද්දීත් කැලෑව තුළින් මතු වූ එම විජ්ජාකාර ස්වාමින්වහන්සේ ගැන මගේ සිත තුළ විශ්වාසයක් ගොඩනැගී තිබුණු නිසාවෙන්, 'උන්වහන්සේගේ තීරණය නිවැරදි ය.' යන මතයේ මම දැඩිව සිටියෙමි. එහෙත් එය නිවැරදි නම් මා එය කෙසේ හෝ තහවුරු කරගත යුතු ය. එය කරන්නේ කෙසේ ද?

මම කල්පනා කරන්නට වීමි.

ඊට පහුවෙනිදා මම පදියතලාව මහ රෝහල වෙත ගියෙමි. මෙම මරණය පිළිබඳව මම රෝහලෙන් වෛද්‍ය පරීක්ෂණ වාර්තාවත් ඉල්ලා සිටියෙන් තරුණියගේ දේහය පරීක්ෂාවට ලක්කළ වෛද්‍යවරයා ඔහුගේ අවසන් නිගමන වාර්තාව මා හට ලබා දෙන බවට ප්‍රකාශකොට සිටියේ ය. ඒ අනුව රෝහලට ගිය මම අදාළ වෛද්‍යවරයා සමග ඒ ගැන කතා කරන්නට වීමි.

"ඔබතුමා හිතන විදියට මේක ඝාතනයක් ද සියදිවි නසාගැනීමක් ද?" මම ඔහුගෙන් ද විමසුවෙමි.

ඔහු දැසත් පුංචි කොටගෙන ඔහු අතේ වූ වෛද්‍ය වාර්තාව දෙස බලාගෙන සිටියේ ය."මම කරපු පරීක්ෂණවලින් නම් මහත්තයෝ මේක ඝාතනයක් කියලා හිතන්න සාක්ෂියක් නෑ. මම මේ දරුවගේ ශරීරය පරීක්ෂා කළා. එහෙම සලකුණක් තියෙනව නම් මට හමුවෙන්න එපැයි. හැබැයි මේ දරුවා මොකක්හරි හේතුවකට ලොකු කම්පනයකින් ඉඳලා තියෙනවා. මරණයට කලින් ලොකු වේදනාවකට මුහුණදීලා තියෙනවා. ඒක හැබැයි උදරය පසාරු කරගෙන ගිය උල නිසා ඇතිවුණ වේදනාව වෙන්නත් පුළුවන්. කොහොමත් පොළොවට වැටිලත් විනාඩි දෙක තුනක් විතර මෙයා එතැනින් නැගිටින්න වෙරදරන්න ඇති. මේ දරුවගේ අත්ලේ තියෙන සලකුණුවලින් අපිට ඒක පැහැදිලිව ම කියන්න පුළුවන්."

"එතකොට ඩොක්ටර්, මෙයා සියදිවි නසාගැනීමට උත්සාහ කෙරුව කෙනෙක් නම් මරණයට පත්වෙන මොහොතේ ඒකෙන් ගැලවෙන්න උත්සාහ කරන්නේ නෑ නේද?"

'ඇයි නැත්තේ මහත්තයෝ...?" වෛද්‍යවරයා මඳ සිනහවක් පෑවේ ය.

"කවුද මැරෙන්න බය නැත්තේ? මැරෙන්න කැමැත්තෙන් හිටිය කෙනෙක්ට වුණත් මැරෙන මොහොතෙදි මරණ බය දැනෙනවනේ, ඒක හැම මනුස්සයෙක්ට ම පොදු දෙයක්. ඉතින් මේ දරුවටත් අවසන් මොහොතෙදි මරණ බය දැනෙන්න ඇති, එයා ඒ නිසාම උත්සාහ කරන්න ඇති මරණයෙන් ගැලවෙන්න."

★★★

වෛද්‍යවරයාගේ නිගමනයත් සියදිවි නසාගැනීමක් ලෙස අවසන් වූ පසුව මම තවත් අසරණ වීමි. තරුණියගේ මරණය වෛද්‍යවරයාත් සියදිවි නසාගැනීමක් ලෙස තහවුරු කොට ඇත්නම් මෙය ඝාතනයක් ලෙස ඔප්පු කිරීම බොහෝ අපහසු කටයුත්තකි. එසේ කිරීමට නම් මේ සියළුම පරීක්ෂණ උඩු යටිකුරු කළ හැකි ප්‍රබල සාක්ෂියක් මා විසින් සොයාගත යුතු ය. එසේ නැතහොත් මරණ පරීක්ෂකවරයා කියූ ආකාරයට අධිකරණ අවසරයක් ගෙන රස පරීක්ෂණයක් ඉල්ලා සිටිය යුතු ය. එහෙත් එසේ කළ පමණින් ප්‍රයෝජනයක් ඇත් ද?

රස පරීක්ෂණයකින්වත් මෙය ඝාතනයක් බව ඔප්පු නොවුණහොත්, එය එතැනින් ම අවසන් වී යනු ඇත.

හැරත්, මා මේ මතයේ එල්බ සිටින්නේ හාමුදුරුවන්ගේ නිගමනය නිසා ම පමණක් බැවින් 'මරණ පරීක්ෂකවරයා හෝ වෛද්‍යවරයාගේ නිගමනයන්ට වඩා උන්වහන්සේගේ තීරණය මා පිළිගත යුතු ද?' මම සිතනන්ට වීමි.

"ඔව්..."

මගේ හදවත සෙමෙන් කොඳුරන්නට විය.

මම උන්වහන්සේව බොහෝ සෙයින් විශ්වාස කරමින් ඇත.

එය මහ අරුම පුදුම විශ්වාසයකි. එකම මොහොතක පමණක් මා ඉදිරියට ආ උන්වහන්සේ මායාවක් සේ මගේ සිතුවිලි වෙනස්කොට ඇත. මම උන්වහන්සේ කෙරෙහි පැහැදී සිටියෙමි. ඒ මීට කලින් මෙවන් හාමුදුරුනමක් මට මුණගැසී නොතිබුණු නිසා විය හැක. එසේ නැතහොත් උන්වහන්සේගෙන් මා දුටු එම විචාරශීලී හෝ නිරීක්ෂණයකින් නිගමනයක් කරා යෑමේ අපූරු ගුණාංගය නිසා විය හැක. කෙසේ හෝ එය මායාවකි. උන්වහන්සේ වැරදි යැයි මගේ සිත නොපිළිගන්නේ ඒ මායාව නිසා ජනිත වූ විශ්වාසය නිසාවෙනි.

★★★

රෝහලෙන් පිටතට පැමිණි පසු මම ඒ මොහොතෙ ම යළිත්

පොලිස් ස්ථානය කරා ගියෙමි. පොලිස් ස්ථානයේ සේවය කරමින් සිටි කොස්තාපල්වරයෙකු සහ පැමිණිලි අංශයේ සටහන් ලියාගන්නා පොලිස් කාන්තාවක් ද ගමනට එක්කාසු කරගත් මම ඔවුන් ද සමග මියගිය තරුණියගේ නිවස කරා යන්නට වීමි.

කුමන ආකාරයකින් හෝ 'මෙය ඝාතනයක් යැයි ඔප්පු කළ හැකි සාක්ෂියක් සොයාගත යුතු ය.' මා එම තීරණයේ දැඩිව එල්බ සිටියෙමි.

ඇයගේ නිවස පිහිටියේ කඳු බෑවුමක සිට ගලාගෙන යන මාදුරු ඔයේ අතු ගංගාවකට මඳක් නුදුරිනි. මෙම ගම්මානයේ ඇති බොහෝමයක් නිවාස මෙන් මෙයත් කුඩා පැල්පතකි. කටු මැට්ටෙන් සාදා පොල් අතුවලින් සෙවිළිකොට තිබුණු එය ප්‍රමාණයෙන් ද කුඩා එකක් වූ බැවින් තරුණියගේ දේහය නිවසට ගෙනා පසුව එය නිවස තුළ තැබීමට තරම් ඉඩකඩක් එහි ඇත්දැ යි මම පුදුමයට පත්වීමි.

කෙසේ හෝ ඔවුන් එය කරගනු ඇත. ගම්මානයේ මිනිසුන්ට දුක හොඳ හැටි පුරුදු ය. අපි එය අසරණකම ලෙස හඳුන්වනු ලැබුවත් මේ මිනිසුන්ට එම අසරණකමත් සාමාන්‍ය ජීවිතයක් ම පමණකි.

මම ජීප් රථය නිවස ඉදිරියට ගෙනෙන විට නිවස වටා රැස්වී සිටි ගැමියන් කිහිපදෙනෙක් මා දෙස විමතියෙන් බලන්නට විය. ඔවුන් ඉදිරියේ ම ජීපය නැවැත්වූ මම එයින් බැසගත්තෙමි.

"කෝ මැරුණු දරුවගේ දෙමව්පියන්?"

ඒ අවට විපරම් කරමින් මම උස් හඬින් ඇසුවෙමි. සෙනඟ අතර සිටි කාන්තාවක් මා ඉදිරියට එන්නට විය. ඇය හැට්ටයක් සහ රෙද්දක් ඇඳගත් කෙසඟ අයෙකි. ඇයත් සමග උස, ඇය හා සමාන ම කෙසඟ සිරුරක් ඇති පිරිමියෙක් ද විත් මා ඉදිරියේ සිටගත්තේ ය.

"එතකොට මේ නැතිවෙලා තියෙන්නේ තමුන්ගේ දුව ද?" මම ඇසුවෙන් කාන්තාව කඳුළු පිසලමින් අඬන්නට පටන්ගත්තා ය.

"ඔව් මහත්තයෝ. අපේ පොඩි එකී, සඳලි..."

"වයස?"

"අවුරුදු දහනවයයි මහත්තයෝ."

මම පිරිමියා දෙස බැලුවෙමි. ඔහු සිටියේ වේදනාවකින් වුවත් ඔහු ඇඬුවේ නැත. ඒ වෙනුවට හැම තාත්තෙක් ම කරන්නාක් මෙන් ඔහු දෑස හංගාගෙන එම වේදනාව විඳිමින් සිටියේ ය.

"අපි ආවේ වෛද්‍ය පරීක්ෂණ ඉවරයි කියලා කියන්න. මැරුණු දරුවගේ

දේහය රෝහලෙන් අද ගන්න පුළුවන්." මම එසේ කියත් ම දරුවා ගැන ඇසීමෙන් සංවේදී වූ කාන්තාව ළතෝනි දෙමින් එතැන ම ඇදවැටී අඬන්නට පටන්ගත්තා ය. පිරිමියා ඇයව ඔසවාලීමට උත්සාහ කළ මුත් ඔහුට එය කළ නොහැකි වූ තැන ඔහු හිස් මුහුණකින් යුක්තව මා දෙස බලා සිටින්නට විය.

"කවුරුහරි ඇවිත් මේ අම්මව ගේ ඇතුළට එක්ක ගියා නම්..." මම කෑ ගසා කීවෙමි. එවිට එතැන සිටි කාන්තාවන් දෙදෙනෙකු විත් ඇයවත් වත්තන් කරගෙන නිවස තුළට යන්නට විය. මම පිරිමියා දෙසට හැරුණෙමි.

"අපිට තේරෙනවා හැමෝම ඉන්නේ වේදනාවෙන් බව. ඒත් අපි ආවේ මේ දරුවගේ මරණය ගැන කටඋත්තර ගන්න. දරුවගේ සිරුර මෙතැනට ගේන්න කලින් අපි මේක කරලා ඉවර කරන්න ඕන." මම ඔහුට කීවෙමි.

තරුණියගේ පියා වටපිට බැලුවේ ය. ඔහුගේ මුහුණේ ඇත්තේ බොහොම සන්සුන්කමකි. ඔහු වේදනාවෙන් සිටින බැව් මට දැනුණ මුත් මෙවන් ආකාරයෙන් සන්සුන්ව සිටින්නේ කෙසේදැ යි මටත් පුදුමයකි.

"මහත්තයට කටඋත්තර ගන්න ඕන කිව්වේ මගෙන් ද?" ඔහු එම හිස් බවින් යුත් මුහුණෙන් ම මගෙන් අසන්නට විය.

"ඔව්... ඔයාගෙනු යි, දරුවගේ මවගෙනු යි දෙන්නගෙන් ම. තව කවුද මේ ගෙදර ඉන්නේ, ඒ මැරුණු දරුවට සමීප අය එහෙම?"

"කවුරුත් නෑ මහත්තයෝ. මමයි, මගේ මැණිකෙයි, ලොකු දුවයි විතරයි."

"ලොකු දුව කිව්වේ?"

"මැරුණු කෙනාගේ අක්කා, මැරුණු දරුවට වඩා අවුරුද්දයි වැඩිමහල්."

"හරි, ඒ දරුවටත් එන්න කියන්න. හැබැයි මේ මිස්ට සටහන් ලියාගන්නත් එක්ක ඉඳගන්න තැනක් තිබ්බොත් හොඳයි." මම කටඋත්තර සටහන් කරගැනීමට සූදානම්ව සිටි පොලිස් නිලධාරිනියව පෙන්වමින් කීවෙන් ඇය ඒ මොහොතෙ ම අත්බෑගය විවර කොට එහි තිබුණු සටහන් පොතක් සහ පෑනක් එළියට ගත්තා ය.

"අපි එහෙනම් ගෙදරටම යමු මහත්තයෝ, මේ හරියේ ඕක ලියාගන්න වෙන තැනකුත් නෑ." මඳක් වටපිට බැලූ පිරිමියා අපිට ඉස්සර විය. ඔහු නිවස දෙසට ඇවිදින්නට වූවෙන් මමත් අනිත් දෙදෙනාත් ඔහු පසුපසින් යන්නට වීමු.

★★★

මෙම නිවසේ සාලය මම පිටතින් දුටුවාක් මෙන් ම ප්‍රමාණයෙන් කුඩා එකකි. එහි තැන් කිහිපයක ම දිගු බංකු තබා තිබුණු අතර සාලය පැත්තකට

වෙන්න අබලන් වූ ලෑලි මේසයක් මත බුලත් හෙප්පුවක් තබා ඇත. සාලයට ගිය පසුව මමත් අනෙක් නිලධාරීන් දෙදෙනාත් එතැන වූ බංකුවේ ඉඳගත්තෙමු.

"අපිට කටඋත්තරය ගන්න ඕන ගෙදර අයෙගෙන් විතරයි, ඒ නිසා අනිත් අය එළියට ගියොත් හොඳයි."

මම නිවසේ තැන්තැන්වල ඉඳගෙන සිටි කාන්තාවන් කිහිපදෙනෙකු දෙස බලා කීවෙන් ඔවුන් එකා දෙන්නා නිවසින් පිටවයන්නට විය.

කොස්තාපල්වරියට 'සියල්ල ම සටහන් කරගන්න' යි ඉඟි කළ මම රාජකාරියට සූදානම් වූවෙමි. සාලයේ පැත්තක සිටි කාන්තාවත්, ඔවුන්ගේ ලොකු දියණිය යැයි කියූ දැරියවත් අප ඉදිරියට ගෙන්වාගත් මම ඔවුන්ට ද ඒ අසල ම වූ බංකුවේ ඉඳගන්නැ යි පවසමින් ප්‍රශ්න කිරීම ආරම්භ කළෙමි.

"එතකොට මේ මැරුණු දරුවා පවුලේ බාලයා?"

"ඔව් මහත්තයෝ, බාලයා."

"වයස?"

"අවුරුදු දහනමය යි. මේ අවුරුද්දේ තමා කෙල්ල සාමාන්‍ය පෙළ කරන්නට හිටියේ."

"හ්ම්, එතකොට මේ ගැහැනු ළමයා ඒ දරුවගේ අක්කා?" මම අප ඉදිරියේ ම හිටගෙන සිටි තවත් දැරියක්ව පෙන්නමින් ඇසූවෙන් කාන්තාව ඇය දෙස නොබලා ම කෙදිරිලි හඬකින් මෙසේ කීවා ය.

"ඔව් අක්කා, මැරුණු කෙනාට වඩා අවුරුද්දයි වැඩිමහල්."

"වෙන ළමයි එහෙම?"

"නෑ මහත්තයෝ... මෙයයි, නැතිවුණ දරුවයි විතරයි." කාන්තාව එසේ පවසා, එක්වර ම හඬන්නට පටන්ගත්තා ය.

"මේ දෙන්නා හැරෙන්න අපිට තව දරුවෙක් හිටියා. එයත් පොඩි කාලෙම නැතිවුණා." ඇය ඉහළ බලාගෙන හූල්ලන්නට පටන්ගත්තා ය.

"අඩු වයසින් දරුවෝ මැරෙන්න තරම් අපි මොන පවක් කරලා තියෙනව ද දන්නෑ මහත්තයෝ..." ඇය හඬන්නට වූවෙන් මට ටික මොහොතක් ඈ සන්සුන් වෙනතුරු බලා සිටින්නට විය.

"එතකොට මේ සිද්ධිය වුණ ඉරිදා උදේ වරුවේ කීයට විතර ද ඒ දරුවා ගෙදරින් පිටත්වුණේ?"

මම පියාගෙන් ඇසුවෙන් ඔහු දැතත් පපුවේ බැඳගෙන කල්පනා කරන්නට

විය.

"උදේ අටට විතර.. ඔව් අටට විතර."

"කොහොම ද ඒක හරියටම කියන්නේ?"

"කෙල්ල ගෙදරින් යද්දි මම හිටියේ මේ සාලෙමයි මහත්තයෝ, ඔන්න ඔය මහත්තයා ඉඳගෙන ඉන්න බංකුවේ."

"ඒ කියන්නේ දරුවා ගෙදරින් පිටවුණේ අටකුත් ගාණකට?"

"ඔව්... මම ඒ වෙද්දී හේනට යන්න සූදානම් වෙලා හිටිය නිසා මට ඒක හොඳට මතකයි."

"එතකොට ඒ වෙලාවේ මේ අම්මයි දුවයි කොහේද හිටියේ?" මම කාන්තාවත්, අනෙක් තරුණියත් දෙස බලා ඇසුවෙන්, හඬමින් සිටි කාන්තාව චීත්තයෙන් ඇයගේ දෑස් පිසදාගන්න ගමන් මෙසේ කීවා ය.

"මේ ගෙදරම තමා මහත්තයෝ. මම අර මිදුලේ කොස් ගහ ළඟ හිටියේ, මේ ලොකු එකීත් එක්ක ඒ හරිය සුද්ධ කරන ගමන්. මම දැක්කා ඒ වෙලාවේ කෙල්ල පොත් මිටියත් තුරුල්කරගෙන ගෙදරින් යනවා. මම ඒත් ඒකිගෙන් ඇහුවා කොහේද මේ උදේ පාන්දරම යන්නේ කියලත්."

"දරුවා මොකක් ද කිව්වේ?"

"පන්ති යනවා කිව්වා මහත්තයෝ."

"ඉරිදා?"

"ඔව්, ඔය ටවුමේ සර් කෙනෙක් ඉරිදා උදේ පන්තියක් කරනවා... ගණිතය හරි..." ඇය තමා අසල සිටි දියණිය දෙස බැලුවෙන්,

"ගණිතය නෙමෙයි සර් විද්‍යාව, අපේ නංගී විද්‍යාව පන්ති තමයි ඉරිදා උදේට යන්නේ." ඇය කීවා ය.

"එතකොට පන්ති පටන් ගන්නේ කීයට ද?"

"උදේ දහයට සර්."

"දහයට...? ඇයි දහයට පටන් ගන්න පන්තියට මේ ළමයා උදේ අටට යන්න පිටත් වුණේ?"

"ටවුමට මෙතැන ඉඳන් දුරයිනේ මහත්තයෝ." මව යළි කතා කරන්නට පටන්ගත්තා ය."කොහොමත් මෙතැන ඉඳන් ඔය ටවුමට යද්දි පැයක්වත් යනවා. කෙල්ල පන්තියට ගිහින් විවේක ගන්නත් එපැයි."

"ඔව්, වේලපහ යන එක නම් ප්‍රශ්නයක් නෑ තමයි. ඒත් ප්‍රශ්නේ තියෙන්නේ

ඇයි ඒ ළමයා පන්තියට නොගිහින් දුම්මාගලට ගියේ කියන එක"

මම එසේ අසද්දී මව ගොළුවී ගියා ය. ඈ අසල සිටි තරුණියත් බිම බලාගත් අතර, ඇයගේ පියා සුපුරුදු හිස් බැල්මෙන් ම මා දෙස බලා සිටින්නට විය.

"ප්‍රශ්නේ තියෙන්නේ එතැන... පන්ති යනවා කියලා උදේ අටට ගෙදරින් පිටවුණ කෙනා දුම්මාගලට යන්නත්, උදේ දහයට කන්දෙන් පැනලා මැරෙන්නත් මොකක්හරි හේතුවක් තියෙන්න ඕන."

මම එසේ පවසා යළිත් ඔවුන් තුන්දෙනා දෙසම බැලුවෙමි. මා තුළ වූ ප්‍රශ්නාර්ථය ම ඔවුන්ගේ මුහුණුවලත් තිබුණා හැරෙන්න ඔවුන් සතුව එම ප්‍රශ්නයට පිළිතුරක් තිබුණේ නැත.

"අන්න ඒ ප්‍රශ්නෙට තමයි අපි උත්තරයක් හොයාගන්න ඕන."

අපි සියල්ලන් ම ටික වෙලාවක් නිහඬව සිටින්නට වීමු. තරුණිය පන්ති යාම පසෙක ලා දුම්මාගලට තකහනියේ ම ගියා නම් එයට කුමක් හෝ විශේෂ හේතුවක් තිබිය යුතු ය.

"එතකොට මේ අක්කා දන්නෙත් නැද්ද නංගි මොකට ද කන්දට ගියේ කියලා?"

"නෑ මහත්තයෝ." ඇය හිස දෙපසට වැනුවා ය. මියගිය තරුණිය මඳක් පැහැපත් කෙනෙකු වුවත් මැය ඊට වඩා අඳුරු සමක් ඇත්තියකි. උදෑසන සිට හැඬීම නිසාම ඇයගේ දෑස් ද කෙවෙනිවලින් ඉලිප්පී විත් රක්තවර්ණ වී ඇත. ඒ ලැජ්ජාව නිසාමදෝ ඇය කතා කළේ මුහුණ හංගමිනි.

"ඔය මැරුණු දරුවගේ වයස අවුරුදු දහනවයක් කිව්ව නේ?"

"ඔව් මහත්තයෝ."

"මේ වයසේ කෙල්ලෙක්ට..." මම කටඋත්තර සටහන් කරගනිමින් සිටි පොලිස් කොස්තාපල්වරිය දෙස බැලුවෙමි. ඇයටත් මා අසන්නට යන ප්‍රශ්නය වැටහෙන්නට ඇත. ඇය එය නිවැරදි බැව් පවසමින් හිස වැනුවා ය.

"මේ දරුවට මොකක්හරි සම්බන්ධයක් එහෙම තිබ්බ ද?"

"සම්බන්ධයක් කිව්වේ මහත්තයෝ?"

"ප්‍රේම සම්බන්ධයක් එහෙම, මොකද වයස අවුරුදු දහනවයක් කියන්නේ ඒ ඔය වගේ දේවල් ගැන හිතන අවධිය."

"අපි දැනුවත්ව නම් එහෙම එකක් නෑ." ඇයගේ මව කීවෙන් මම පියා දෙස බැලුවෙමි. ඔහු ඒ සඳහා පිළිතුරක් දුන්නේ නැත. එහෙත් එතැන සිටි

තරුණියත් මව මෙන් ම"එහෙම එකක් නෑ මහත්තයෝ" යැයි පැවසුවෙන් මම ඇය දෙස සෘජු බැල්මක් හෙළුවෙමි.

"තමුන් කොහොම ද එහෙම හරියට ම කියන්නේ?" මම ඇයගෙන් ඇසුවෙමි.

"එහෙම එකක් තිබ්බ නම් නංගි මට කියනවා, එයා එහෙම හංගන් ඉන්න කෙනෙක් නෙමෙයි."

"හරි, බොහෝම හොඳයි." කියූ මම තවත් ප්‍රශ්න ඇත්දැ යි ඇසීමට මෙන් පොලිස් කොස්තාපල්වරිය දෙස බැලුවෙමි. ඇය එවිට හිස ඔසවා තරුණිය දෙස බැලුවා ය.

"එතකොට නංගි කා එක්කවත් අමනාපයෙන් එහෙම හිටියේ නැද්ද? එයත් එක්ක තරහා කෙනෙක්වත්"

තරුණිය කල්පනා කළේ නැත. එකඑල්ලේ ම පොලිස් කාන්තාව දෙස බැලූ ඈ"නෑ නෝනා, නංගි හරි අහිංසකයි. එයා කා එක්කවත් පැටලෙන්න යන කෙනෙක් නෙමෙයි" යැයි කීවෙන් පොලිස් කාන්තාව නිහඬ බැල්මකින් මා දෙස බැලුවා ය.

අපි එදින නිවැසියන්ගේ සේ ම ඒ අවට සිටි තරුණියව හඳුනන කිහිපදෙනෙකුගෙන් ද කටඋත්තර සටහන් කරගත්තෙමු. එහෙත් සැකයට තුඩුදිය හැකි යමක් හෝ තරුණිය උදෑසන අටට නිවසෙන් පිටව පන්ති යනවා යි පවසා දුම්මාගලට යෑමේ හේතුවවත් දැනගැනීමට මට නොහැකි විය.

ඒ අතර මම එතැන සිටි තවත් ගම්වාසීන් කිහිප දෙනෙකුගෙන් මට කැලෑවේ දී හමු වූ ස්වාමීන්වහන්සේ ගැන ද විචාළෙමි.

"උන්වහන්සේත් ඔය දුම්මාගල කිට්ටුවම වාසය කරන ස්වාමීන්වහන්සේ නමක්." එක් අයෙකු අපිට කීවේ ය.

"දුම්මාගල කොයි හරියෙ ද?"

"ඔය ගඟ කිට්ටුවෙන් අවසන් වෙන හරියේ. මහත්තයා ඔහොම ම වැලි පාර දිගේ පහතට ගියාම මාදුරු ඔයේ මායිම අහුවෙනවා. ඕක පටු ගඟ, ඒ ගඟ හරහා ඒ දණ්ඩක් දාලා ඇති ඒක දිගේ ගඟෙන් එහා පැත්තට යන්න පුළුවන්. එතැනින් තමයි දුම්මාගලේ එහා ඉවුරේ බෑවුම පටන්ගන්නේ, එතැනින් ටික දුරක් උඩට යද්දි මහත්තයට ගල්තලාවේ අටවලා තියෙන පැලක් දකින්න ලැබෙයි. පැලක් කිව්වේ පොඩි ආවාස ගෙයක්. එතැන තමයි ඒ හාමුදුරුවෝ වැඩ වසන්නේ. හැබැයි මහත්තයෝ..." කී ගැමියා ටික

වෙලාවක් කුමක් හෝ කල්පනා කළේ ය.

"ඇයි මොක ද?"

"නැහැ උන්වහන්සේ ඔය ආවාස ගෙයි බොහෝ දුරට නෑ, මම හිතන්නේ භාවනා කරන්න කැලෑවට යනවා. මම දහවල් කාලයේ නම් උන්වහන්සේව ඔය ආවාස ගෙයි දැකලා නැහැ."

"එතකොට රෑට?"

"ඔව් රාත්‍රියට එනවා. ඇවිත් ඔය ගල්තලාවේ ලොකු ගිනි මැලයක් ගහනවා. මමත් මෙහා ඉවුරේ හේනක් කරන නිසා මම දකිනවා රාත්‍රියට ඒ පැත්තෙන් ගිනිමැලයක් පත්තුවෙනවා."

"අද රෑ තමුන්ට පුළුවන් ද මගෙත් එක්ක උන්වහන්සේව බැහැ දකින්න යන්න එන්න?"

"අද..." ඔහු මඳක් අදිමදි කළේ ය.

"ඔව්... මේක පොලිස් රාජකාරියක්, මේ මැරුණු කෙල්ල ගැනම."

මම එසේ කියද්දී අකමැත්තෙන් මෙන් හිස වැනූ ඔහු එයට එකඟ විය.

මියගිය තරුණිය ගැන හෝඩුවාවක් සොයාගැනීමට නොහැකි වුවත් මගේ සිත අවිවේකී කළ එම විජ්ජාකාර හාමුදුරුවන් වහන්සේ ගැන හෝඩුවාවක් සොයාගැනීමට හැකිවීම ගැන මම සතුටු වූවෙමි. ඊටත් වඩා ගැමියාව එදින රාත්‍රියේ ම උන්වහන්සේව මුණගැසීමට යාමට කැමති කරවා ගැනීමට හැකිවීම ගැනත් මම සතුටු වීමි. එසේ නොවුණා නම් මෙම පරීක්ෂණයේ ඉදිරි වැඩකටයුතු මෙතැනින් ම අවසන් වී යනු නිසැක ය.

★★★

ගැමි පරිසරයන්හි රාත්‍රී කාලය සුන්දර යැයි ඔබ සිතන්නේ ද? එය ඇත්තකි. නගරයේ මෙන් විදුලි ලාම්පු, සැරසිලි නොමැති ගැමි පරිසරය රාත්‍රී ආකාශය රසවිඳින සෞන්දර්යයවේදියෙකුට නම් මනස්කාන්ත ස්ථානයකි. රාත්‍රියේ පැල්පතක් ඉදිරියේ පැදුරක් එලා ආකාශය දෙස බලා සිටින කල වර්ණවත්, අනේකවිධ, මෙතෙක් කිසිමදාක දැක නොමැති, හුරු නුහුරු තාරකා මණ්ඩලය, ග්‍රහලෝක, දිවයන වස්තූන් අනේකවත් දැකගත හැක. එය මනස්කාන්ත දර්ශනයකි. ඒත් ඒ මනස්කාන්ත දර්ශනය තුළ සිර වූ දුක් සහ අභාග්‍යයන් නම් අනන්ත අප්‍රමාණ ය. ගම්බද පෙදෙස්වල රාත්‍රිය නගරයට වඩා භයානක ය. සතුන් සර්පයින් කැලෑවලින් එළියට පැමිණෙන්නේ අඳුර වැටුණු පසු නිසාවෙන් රාත්‍රියේ ගමන් බිමන් යෑම සුදුසු නැත. පැල්පතේ එළිපත්තක වාඩිවුවත් මදුරුවන් සහ කුඩා කෘමීන් සමග